**ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.

| **ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව** | **ක්‍රියාත්මකකර නොතිබුණු නිර්දේශය** | **මෙම වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|
| 1.6.1 (අ) | පෙර වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ අතර වෙනසක් පැවතීම. | 1.6.1 (ඇ) |
| 1.6.1.(ඇ) | ණයගැති ශේෂ සම්බන්ධයෙන් තහවුරු කරගැනීමට සාක්ෂි ඉදිරිපත් නොවීම | 1.6.1. (ඉ) |

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ඒසීඒ - 2 **(iv)** ආකෘතිය හා ඒසීඒ - 2 **(v)** ආකෘතියේ වැඩසටහන් අනුව හා ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණ සාරාංශයේ දේශීය අරමුදල් ලෙස රු.12,569,000,000 ක් හා විදේශ ප්‍රතිපාදන ලෙස ශුද්ධ ප්‍රතිපාදනය රු.2,000,000 ක් ලෙස සටහන් විය යුතු වුව ද, දේශීය අරමුදල් යටතේ ශුද්ධ ප්‍රතිපාදන ලෙස රු.12,571,000,000 ක් පමණක් දක්වා තිබුණි. | මූල්‍යකරණ අංක 11 දේශීය අරමුදල් යටතේ ශුද්ධ ප්‍රතිපාදනය ලෙස රු.12,569,000,000 ක මුදලක් හා මූල්‍යකරණ අංක 13 විදේශ ප්‍රදාන යටතේ රු.2,000,000 ක මුදලක් ලෙස සටහන් විය යුතු බවත්, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන සකස්කළ යුතු බවට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදුන් බවත් දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ඒසිඒ - 2 (ii) ආකෘතියේ දැක්වෙන වියදම් ප්‍රකාශයෙහි 2509-14 වැය විෂයය යටතේ මූල්‍යකරණ සංකේත අංකය 13 ලෙස දැක්විය යුතු වුවද එය 11 ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු බවට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදුන් බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව අයවිය යුතු කේවල ශේෂ මුළු වටිනාකම රු.209,493,057 ක් විය. මින් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයවිය යුතු ණය ශේෂය හැර සමාලෝචිත වර්ෂයේ අවසානයේ අයවිය යුතු ණය ශේෂය රු.11,256,020 ක් වූ අතර, මෙම ශේෂය තුළ වර්ෂයකට වඩා වැඩි හිඟහිටි ණය ශේෂවල වටිනාකම රු.7,166,507 ක් විය. | වසර ගණනක සිට බන්ධනාගාර මූලස්ථානයේ හා බන්ධනාගාර ආයතන 29 හි අත්තිකාරම් බී ගිණුමට අදාළව හිඟ ණයශේෂයන් පවතී. මෙම හිඟ ණයශේෂයන් විශ්‍රාම ගිය, මියගිය, සේවය අතහැර ගිය, වැඩ තහනම් කළ හා සේවයෙන් පහ කළ ලෙස වර්ග කර ඇත. එම හිඟහිටි ණය, ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 වන වගන්තීන් ප්‍රකාරව අය කිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ ණයශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගගත යුතු ය. |
| (ii) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමට අදාළ සැසඳුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරන ඇමුණුම 3.8.1 යටතේ ඉදිරිපත් කරන වෙනත් හිඟහිටි ණයශේෂ යටතේ වසර 03 වැඩි කාලයක සිට පැවත එන රු.401,153 ක ණයශේෂයක් පැවති අතර, මෙම ණයශේෂ කුමන නිලධාරීන්ගෙන් අයකර ගත යුතු ද යන්න නිශ්චිතව හඳුනාගැනීමට නොහැකි වී තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ හා වාරියපොළ බන්ධනාගාරයේ හඳුනාගත නොහැකි ශේෂයන් වශයෙන් රු.401,153 පවතී. එයින් රු.2,095 ක මුදලක් ප.වි.පු මධ්‍යස්ථානයේ පවතින අතර, එය 2008 වර්ෂයේ සිට පවතින ණයශේෂයක් වන බැවින්, හඳුනාගැනීමට නොහැකි වී ඇත. | හිඟ ණයශේෂ හඳුනාගෙන කඩිනමින් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය. |

**(ඇ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අංක 6000-0-0-006-0-081 දරන තැන්පත් ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට සිරකරුවන්ගේ පුද්ගලික බැංකු ගිණුමට බැර කිරීමට අදාළ රු.5,413,490 ක ශේෂයක් පැවතුණු අතර, මෙම ශේෂයෙන් රු.805,661 ක ප්‍රමාණයක් එනම් සියයට 15 ක් වසර 02 කට අධික කාලයක සිට පොදු තැන්පත් ගිණුමේ පැවතුණි. | සිර වේතන හිමි සිරකරුවන්ට අදාළ බැංකු ගිණුම් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, කඩිනමින් අදාළ ගිණුම් විවෘත කර එම සිර වේතන අදාළ සිරකරුවන්ගේ බැංකු ගිණුම්වලට බැර කිරීමට කටයුතු කරන බව විගණනය වෙත කාරුණිකව දැනුම් දෙමි. | සිර වේතන සිරකරුවන්ගේ පුද්ගලික බැංකු ගිණුමට කාලපමාවකින් තොරව බැර කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ii) | අංක 6000-0-0-1-16 දරන තැන්පත් ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට නිලධාරින්ගේ වැටුපෙන් අය කරනු ලබන ඇප මුදල් වශයෙන් රු.4,234,468 ක ශේෂයක් පැවතුණු අතර, මෙම මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 885 ප්‍රකාරව කටයුතු කර නොමැති අතර, මෙම ශේෂයෙන් රු.995,603 ක ප්‍රමාණයක් එනම් සියයට 24 ක තැන්පතු වසර 02 කට අධික කාලයක් තුළ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන පැවතුණි. | ඇප තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 885 ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු කිරීමටත් ගිණුම් විවෘත නොකළ නිලධාරීන් වෙනුවෙන් කඩිනමින් ගිණුම් විවෘත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් සියළුම ආයතනවල බන්ධනාගාර අධිකාරීවරුන්ට උපදෙස් ලබාදීමට කටයුතුකර ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 885 ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතු ය. |

**(ඇ) දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂය | විගණන විමසුමේ අංක 06 මූල්‍ය නොවන වත්කම් යටතේ (අ),(ආ),(ඇ),(ඈ),(ඉ) ලෙස | පූර්ව වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ඒසීඒ - 6 ආකෘතියේ අවසාන ශේෂය හා |

| | | | |
|---|---|---|---|
| | රු.10,223,624,941 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ-82) අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.10,042,573,381 ක් වූයෙන් ආරම්භක ශේෂය අතර රු.181,051,560 ක වෙනසක් නිරීක්ෂණය විය. | දක්වා ඇති ශේෂ අතර නොසැසඳීම් සම්බන්ධයෙන් හේතු සොයා ගැනීම සඳහා තාක්ෂණික දැනුමක් දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවී අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. 2022 වර්ෂයට අදාළව මෙවැනිම ශේෂ නොසැසඳීම් පැවති අතර, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා එක්ව අදාළ නිවැරදි කිරීම් සිදුකළ ද ඉහත සඳහන් **CIGAS** වැඩසටහනේ නව සංස්කරණය සමඟ නිකුත් කළ උපදෙස් පත්‍රිකාව අනුව කටයුතු කිරීමෙන් පසු අදාළ දෝශයන් නැවතත් ඇතිවී ඇති බව දන්වා ඇත. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ඒසීඒ - 6 ආකෘතියේ ආරම්භක ශේෂය සමාන විය යුතු ය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.10,223,624,941 ක් වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කර ඇති භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල ඒසීඒ 82 ආකෘතියට අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.10,025,820,167 ක් වූයෙන් ආරම්භක ශේෂය අතර රු.197,804,774 ක වෙනසක් නිරීක්ෂණය විය. | | පූර්ව වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ඒසීඒ - 6 ආකෘතියේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ඒසීඒ - 6 ආකෘතියේ ආරම්භක ශේෂය මෙන්ම භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය සමාන විය යුතු ය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අඩංගු ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ- 82) අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයට ගැළපීම රු.1,240,533,864 ක් වුව ද, විගණනයට ඉදිරිපත්කර ඇති භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල එස්ඒ-82 ආකෘතියට අනුව එය රු.620,395 ක් වූයෙන් රු.1,239,913,469 ක වෙනසක් නිරීක්ෂණය විය. | | මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ - 82) හා විගණනයට ඉදිරිපත්කර ඇති භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල එස්ඒ - 82 ආකෘතියට අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයට ගළපන ලද එකතු කිරීම් සමාන විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (iv) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති එස්ඒ - 82 ආකෘතිය (ඒසීඒ - 6) ට අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය රු.11,189,480,019 ක් වුව ද, විගණනයට ඉදිරිපත් කර ඇති එස්ඒ - 82 ආකෘතිය අනුව එම ශේෂය රු.10,211,189,928 ක් වූයෙන් අවසන් ශේෂය අතර රු.978,290,091 ක වෙනසක් නිරීක්ෂණය විය. | | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති එස්ඒ- 82 ආකෘතිය (ඒසීඒ - 6) හා විගණනයට ඉදිරිපත්කර ඇති එස්ඒ- 82 ආකෘතියේ අඩංගු මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂ සමාන විය යුතු ය. |
| (v) | විගණනයට ඉදිරිපත්කර ඇති එස්ඒ-82 ආකෘතිය හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂයන් අතර රු.978,290,091 ක වෙනසක් නිරීක්ෂණය විය. | | විගණනයට ඉදිරිපත්කර ඇති එස්ඒ-82 ආකෘතිය හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂ සමාන විය යුතු ය. |
| (vi) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති ඒසීඒ - 6 ආකෘති (එස්ඒ - 82) යෙහි වැය විෂයය අංක 9152-2-1 හා 9152-2-2 යටතේ 2023 දෙසැම්බර් 31 දිනට එකතුව වශයෙන් දැක්වෙන ප්‍රවාහන හා අනෙකුත් යන්ත්‍ර හා උපකරණවල ශේෂය පිළිවෙලින් රු.938,924,404 ක් හා රු.733,912,844 ක් ලෙස දැක්වුව ද, එහි නිවැරදි එකතුව පිළිවෙලින් රු.938,863,254 ක් හා රු.733,973,994 ක් විය. | SA – 82 ආකෘතිය සිගාස් වෙබ් අතුරු මුහුණත මඟින් ජනනය කරන බැවින් අදාළ ආකෘතියෙහි ඇති වෙනස්කම්වලට හේතුව තාක්ෂණික කාරණාවක් බව ද දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති වත්කම්වල එකතුව නිවැරදිව දැක්විය යුතු ය. |
| (vii) | 2023 වර්ෂයේ සිරකරු සුභසාධක අරමුදලට පරිත්‍යාග වශයෙන් ලද රු.6,815,234 ක් වූ ජංගම නොවන වත්කම් අතුරින් රු.1,731,476 ක වත්කම් ද, මීගමුව හා කොළඹ රිමාන්ඩ් බන්ධනාගාර වෙත ලැබී තිබූ වටිනාකම නොදන්නා විෂයයන් 09 කට අදාළ | මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම කඩිනමින් තක්සේරුකර සිගාස් පද්ධතිය මඟින් ගිණුම්ගත කරන ලෙස අදාළ ආයතන වෙත උපදෙස් ලබාදුන් බව දන්වා ඇත. | සුභසාධක අරමුදලට පරිත්‍යාග වශයෙන් ලැබෙන මූල්‍ය නොවන වත්කම් සිගාස් වැඩසටහන මගින් ගිණුම්ගත කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය නොවන වත්කම් ද දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර නොතිබුණි. | | |
| (viii) | මීට අමතරව 2023 වර්ෂයේ සිරකරු සුභසාධක අරමුදලට පරිත්‍යාග වශයෙන් ලද රු.206,197 ක් වූ මූල්‍ය නොවන වත්කම් ගණයට අයත් විෂයයන් 20 ක අයිතම 198 ක් පාරිභෝජ්‍ය වත්කම් ලෙස සලකා සිගාස් පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. | පරිත්‍යාග වශයෙන් අගුණුකොළපැලැස්ස, කළුතර, බෝගම්බර, කෑගල්ල හා මීගමුව යන බන්ධනාගාරවලට ලද මූල්‍ය නොවන වත්කම් ගණයට අයත් විෂයන් 20 කට අදාළ අයිතම 198 කඩිනමින් සිගාස් පද්ධතියට ඇතුළත් කිරීමට අදාළ ආයතන වෙත උපදෙස් ලබාදුන් බව දක්වා ඇත. | සුභසාධක අරමුදලට පරිත්‍යාග වශයෙන් ලැබෙන මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන සිගාස් වැඩසටහන මගින් ගිණුම්ගත කළ යුතු ය. |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත්කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති රු.148,861,870 ක ලැබිය යුතු ශේෂයෙන් රු.74,238,302 ක ශේෂ තහවුරු කරගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයේදී ඉදිරිපත් නොවී ය. | කර්මාන්ත අංශ පවත්වාගෙන යන බන්ධනාගාර ආයතන විසින් රාජ්‍ය අංශයට සිදුකරන ලද විකුණුම්වලදී සෑම වර්ෂයක් අවසානයේදීම බිල්පත් පියවීමේදී හිඟ බිල්පත් ප්‍රමාණයක් වාර්ෂිකව පවතිනු ඇත. මෙම හිඟ බිල්පත්වලින් වැඩි ප්‍රමාණයක් 2015 ට පෙර ඒවා වූ බැවින්, හිඟ බිල්පත් නිරවුල් කිරීමට ආයතනවලට උපදෙස් ලබාදුන්න ද පැරණි බිල්පත් අස්ථාන ගතවීම නිසා නිවැරදි සංඛ්‍යා ලේඛන ලබාගැනීමට අපහසුවී ඇත. | සම්පූර්ණ ණයගැති ශේෂ තහවුරු කරගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූලධන වැය විෂයයන් 10 ක් සඳහා සලසාගෙන තිබූ රු.858,000,000 ක | මූලධන වැය විෂයන් 10 ක් සඳහා සලසාගෙන තිබූ රු.858,000,000 ක ප්‍රතිපාදනවලින් සියයට 53 කට | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස්කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් රු.456,087,246 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර, එම එක් එක් වැය විෂයයන්හි ඉතිරිවීම සියයට 21 සිට සියයට 100 ක් දක්වා පරාසයක් තුළ පැවතුණි. | වැඩියෙන් එනම් රු.456,087,246 ක් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බවට එකඟ වන අතර, අදාළ වැය විෂයයන් යටතේ වූ ඉතිරිවීම් සඳහා හේතු දක්වා තිබුණි. | |
| (ii) | මූලධන වැය විෂයයන් 02 ක් සඳහා වෙන්කර තිබූ රු.80,000,000 ක ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි 66 යටතේ රු.54,300,000 ක් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කිරීමෙන් පසු රු.25,565,658 ක් ඉතිරිවී තිබූ අතර, එම වැය විෂයයන්හි ශුද්ධ ප්‍රතිපාදනය මත තවදුරටත් ඉතිරිවීම් සියයට 94 සිට 100 ක් දක්වා පරාසයක් තුළ පැවතුණි. | 2104-4 වැය විෂයය යටතේ අඩු වියදම් ඉදිකිරීමේ තාක්ෂණය යොදාගනිමින් **NERD** ආයතනයේ උපදේශනය යටතේ විවෘත තරඟකාරී මිළ ගණන් කැඳවීමට ප්‍රමාණවත් කාලයක් නොවූ බැවින්, මෙම වැය විෂයයේ රු.46,500,000 ක ප්‍රතිපාදන මු.රෙ 66 යටතේ වෙනත් වැය විෂයයන් වෙත මාරු කිරීමට කටයුතු කරන ලදී. 2104-7 වැය විෂයය යටතේ මෙම ඉදිකිරීම්වල අවසාන බිල්පත නිරවුල් කිරීම සඳහා ගෙවීමක් ඇති වේ යැයි අපේක්ෂා කළ ද එවැනි බිල්පත් ඉදිරිපත් නොවූයෙන් මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන අවශ්‍යතාවය සහිත වෙනත් වැය විෂයයන් වෙත මාරුකිරීමට කටයුතු කිරීමෙන් පසු අදාළ වැය විෂයයේ රු.2,065,658 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් උපයෝජනය කිරීමට නොහැකිව ඉතිරි විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස්කළ යුතු ය. |
| (iii) | 2022 දෙසැම්බර් 17 දිනැති හා අංක 09/2022 දරන අයවැය චක්‍රලේඛය මගින් අවධාරණයකර ඇති හා අයවැය ඇස්තමේන්තුවල පූර්විකාවේ 3.1 හි (i) සිට (xii) දක්වා සඳහන් කර ඇති කාර්යයවලට අදාළව පමණක් අමතර ප්‍රතිපාදන ඉල්ලීම් සීමා විය යුතු වුවත්, ඊට අනුගත නොවී දෙපාර්තමේන්තුව විසින් වැය විෂයය අංක 1202, 1203 හා 1403 සඳහා පිළිවෙලින් රු.120,000,000 ක්, රු.1,500,000,000 ක් හා රු.120,000,000 ක් ලෙස එකතුව රු.1,740,000,000 | (i) සිට (xii) දක්වා සඳහන් කර ඇති කාර්යයවලට අදාළව පමණක් අමතර ප්‍රතිපාදන ඉල්ලීම් සීමා විය යුතු බවට අවධාරණයකර ඇතත්, බන්ධනාගාර ආඥා පනත ප්‍රකාරව බන්ධනාගාරගත රැඳවියන් සඳහා 1203 වැය විෂයය වෙනුවෙන් 2022 වර්ෂයේ නිරවුල් නොවූ රු.මි.1,485.9 ක බිල්පත් 2023 වර්ෂයේ ප්‍රතිපාදනවලින් ගෙවීම් කිරීම නිසා 2023 වර්ෂය සඳහා රු.මි.1,888.7 ක පමණක් ප්‍රතිපාදන ඉතිරි විය. බන්ධනාගාරගතව සිටින 28,500 කට ආසන්න රැඳවියන්ගෙන් | ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ක මුදලක් පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලෙස ලබාගෙන තිබුණි. | සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා තවදුරටත් නොවිසඳුනු නඩු පවතින බැවින්, දිවයින පුරා පිහිටා ඇති අධිකරණ වෙත රැඳවියන් ප්‍රවාහනය සඳහා වූ ඉන්ධන මිල අයවැය ඇස්තමේන්තු සකස්කළ කාලයේ පැවති මිලට සාපේක්ෂව ඉහළ යාම, රැඳවියන් සඳහා ආහාර පිසීම සඳහා වූ ගෑස්, ෆර්නස් ඉන්ධන හා දර වෙනුවෙන් වියදම් ඉහළයාම, 2023 වර්ෂයේදී විදුලි ඒකකයක් සඳහා වන ගාස්තුව හා ජල ගාස්තුව ද සංශෝධනය අනුව දෙපාර්තමේන්තුවේ විදුලි හා ජල වියදම ද ඉහළ යාම නිසා මෙම තත්ත්වය ඇති වූ බව දන්වා ඇත. | |

## 2.2. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපත් විගණනය වෙත ලබාදෙන බව ද දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.8 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි. | විගණන විමසුම් සඳහා පිළිතුරු කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නිරීක්ෂණය | | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | | **වටිනාකම (රු.)** | **අනුකූල නොවීම** | | |
| (අ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනත 25(1) | - | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ධාවනයේ යොදවා තිබූ වාහන 32 ක් සඳහා පනත ප්‍රකාරව වලංගු ආදායම් බලපත්‍ර 2023 වර්ෂය සඳහා ලබාගෙන නොතිබුණි. | වාහන ආදායම් බලපත්‍ර කල් ඉකුත්වීමට සතියකට පෙර නව ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා ආයතන අධිකාරීවරුන් දැනුවත් කර ඇති අතර, ප්‍රමාදයන් සිදු වුවහොත් එම නිලධාරින්ගෙන් නිදහසට කරුණු විමසීම් සිදු කරන ලෙසට උපදෙස් ලබාදී ඇත. | මෝටර් වාහන පනතේ ප්‍රතිපාදන අනුව වලංගු ආදායම් බලපත්‍ර ලබා ගත යුතු ය. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 272(3) | 172,241 | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ ගෙවීම් වවුචර් 06 ක් විගණනයට ඉදිරිපත් නොවී ය. | මෙම අඩුපාඩු වළක්වා ගැනීම වෙනුවෙන් වෙනම ම නිලධාරියෙකු පත්කොට දැඩි අධීක්ෂණයක් යටතේ නියමිත පරිදි වවුචර්පත් විගණනය වෙත යොමු කරන ලෙසට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | මුදල් රෙගුලාසි 272(3) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | 571 | 10,834,706 | පොදු තැන්පත් ගිණුම් 04 කට අදාළ වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | පොදු තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් මු.රෙ 571 අනුව කටයුතු කිරීම සඳහා සියලුම ආයතනවල බන්ධනාගාර අධිකාරීවරුන්ට උපදෙස් ලබාදීමට කටයුතුකර ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (iii) | 770(4) | - | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පවත්නා වාහන 31 ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සිදු කර නොතිබීම හා තවත් වාහන 34 ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සඳහා නිර්දේශ ලබාගෙන තිබුණ ද මෙතෙක් අපහරණ කටයුතු අවසන්කර නොතිබුණි. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පවත්නා අපහරණය කළ යුතු වාහන සම්බන්ධයෙන් අදාළ පරීක්ෂා කිරීමේ කටයුතු සිදුකර කඩිනමින් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 770(4) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | 756(6) | - | පෙර වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරි වර්ෂයේ ජූනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ මඩකලපුව බන්ධනාගාරයේ හා පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත්කර නොතිබුණු අතර, තව ද බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සියලුම ආයතනවල පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම පිළිබඳ වාර්තා මෙතෙක් ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට ආයතන දෙකටම අදාළ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර, පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම පිළිබඳ වාර්තා කඩිනමින් ඉදිරිපත් කරන බව ද දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 756(6) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.4. අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 (2)(ආ) ප්‍රකාරව මාණ්ඩලික නොවන නිලධාරියෙකුට තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාදිය නොහැකි වුවත්, පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ මාණ්ඩලික නොවන නිලධාරීන් 05 කට අවස්ථා 38 කදී තත්කාර්යය අතුරු අග්‍රිම වශයෙන් රු.699,280 ක මුදලක් ලබාදී තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය 01/2020 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව මින් ඉදිරියට සියලුම පුහුණු වැඩසටහන් සඳහා මාණ්ඩලික නිලධාරියෙකු විසින් අත්තිකාරම් මුදල් ලබාගෙන කාර්යය නිම වූ විගස අත්තිකාරම පියවීමට කටයුතු කළ යුතු බවට උපදෙස් ලබා දුන් බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | එසේම ලබාගත් අත්තිකාරම් මුදලක් කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුව ද, බන්ධනාගාර මූලස්ථානයේ හා පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ විවිධ කාර්යයන් සඳහා අවස්ථා 70 කදී ලබාදී තිබූ රු.1,536,560 ක අත්තිකාරම්, පිය විය යුතු දිනයේ සිට දින 07 ත් දින 290 ත් අතර කාලයක් ප්‍රමාදකර පියවා තිබුණි. | නිලධාරීන් වෙත තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී අදාළ කාර්යය නිම වූ වහාම එය පියවීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත. රාජකාරී කටයුතුවල සිදුවූ සුළු ප්‍රමාදයන් හේතුවෙන් අත්තිකාරම් පියවීමේ යම් ප්‍රමාදයක් සිදුවී ඇත. | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත පරිදි පියවා නොතිබීම නිසා බන්ධනාගාර මූලස්ථානයේ හා පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ අවස්ථා 46 කදී ලබාගත් රු.1,202,210 ක අත්තිකාරම් මුදල්වලට අදාළව රු.389,773 ක මුදලක් දින 07 ත් 169 ත් අතර කාලයක් තුළ අදාළ නිලධාරියා සතුව පැවතුණි. | නිලධාරීන් වෙත තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු රජයේ මුදල් අවභාවිතාවක් සිදු නොවන පරිදි මු.රෙ 371 (2) ප්‍රකාරව අදාළ කාර්යය නිම වූ වහාම එය පියවීමට කටයුතු කරන ලෙස සියලුම අංශ හා මාණ්ඩලික නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව දක්වා ඇත. | මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**3. මෙහෙයුම්සමාලෝචනය**

**3.1. සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී වර්ෂය තුළ ක්‍රියාත්මක වන සත්‍ය ක්‍රියාකාරකම් හඳුනානොගෙන නාමමාත්‍රික (Dummy) ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන තක්සේරුකර තිබුණි. පසුව සත්‍ය ක්‍රියාකාරකම් අනුව වර්ෂය අවසානයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර තිබුණි. මේ අනුව අස්ථිත්වය විසින් සිදු කරනු ලබන සියලුම කාර්යයන් (භාණ්ඩ,සේවා හා ව්‍යාපෘති) පූර්ණය කිරීමට යොදාගන්නා කළමනාකරණ මෙවලමක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කරගැනීමට නොහැකිව තිබුණු අතර, සකසුරුවමින්, කාර්යක්ෂමව හා ඵලදායී පරිදි කාලානුරූපී ආකාරයට සැලසුම් සම්පාදනය කිරීමේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට ද නොහැකි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ නිශ්චිත කාර්ය හඳුනා නොගෙන නාමමාත්‍රික ලෙස (Dummy) ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ වැය විෂයය 2001, 2002,2003 ට වන අතර, මෙම වැය විෂයයන් තුනෙහිම කාර්යයන් පූර්ව නිගමනයක් කළ නොහැකි නිශ්චිත නොවූ අවස්ථානුකූලව පැන නගින ගොඩනැගිලි අළුත්වැඩියා, යන්ත්‍රෝපකරණ හා වාහන අළුත්වැඩියා වීමයි. එපරිදි වුව ද බලධාරීත්වය විසින් පසුගිය වසරවල පළපුරුද්ද මත පදනම්ව වැය වෙතැයි අපේක්ෂිත මුදලකට සරිලන ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කෙරේ. අදාළ වර්ෂයට වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණයම ක්‍රියාකාරකම්වල අවශ්‍යතාවයේ ප්‍රමුඛතාව මත මනා ලෙස උපයෝජනයට ගැනීමට කටයුතු කරන අතර, ඊට අදාළව සිදුකරනු ලැබූ සංශෝධන හා එමගින් අත්පත් කරගත් ප්‍රගතිය මාසික ප්‍රගති වාර්තා, ප්‍රගති සමාලෝචන රැස්වීම් මඟින් නිරීක්ෂිත අතර, ඉලක්කගත කාර්යයන් කළමනාකරණය කරන මෙවලමක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම කටයුතු කර ඇති බව දක්වා ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු ය. |

## 3.2. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිවයිනේ පාසල් දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ඉතාම අවම මට්ටමක පවතින අවස්ථාවකදී ජාතික පාසලක් වශයෙන් පවත්වාගෙන යන වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය සඳහා ලබාදී ඇති මානව හා භෞතික සම්පත්වලට සාපේක්ෂව ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැතිවීම හා අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ද වඩාත් සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතිය මගින් සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව ඉදිරියේදී වඩාත් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකි සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු සිදු කරන බව දන්වා ඇත. | අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ජාතික පාසලක නිර්නායකයන් අනුව විධිමත්ව පවත්වාගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු ය. |

## 3.3. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බන්ධනාගාරවල පවතින අධික තදබදයට පිළියමක් ලෙස මීගමුව, පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ හදිසි අත්‍යාවශ්‍ය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 135 ක ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත්කර 2020 සැප්තැම්බර් 28 දින වැඩ ආරම්භ කර, 2020 දෙසැම්බර් 31 වන දින වැඩ අවසන් කිරීමට සැලසුම් සකස් කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන වැඩ කොටස් 11 ක් නිම කිරීමට තිබූ අතර, එයින් වැඩ කොටස් 07 ක් සඳහා ඇස්තමේන්තුගත වියදම රු.10,478,341 ක් වූ අතර, ප්‍රතිපාදන ප්‍රමාණය රු.10,125,031 ක් විය. තවත් වැඩ කොටස් 04 ක් සඳහා | මෙම ව්‍යාපෘතිය 2020 වසරේදී ආරම්භ කළත්, රටේ පැවති තත්ත්වය හා ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් වැඩ බිමට ද්‍රව්‍ය සැපයීම හා ප්‍රසම්පාදනය හා වෙනත් හේතු මත සිදු වූ ගැටලු මත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රම දායකත්වයේ ගැටලු හා ඉදි කිරීම් භූමියෙහි භූ ජල මට්ටම ඉතාමත් ආසන්න මට්ටමක පිහිටීමත් මෙම කටයුතු ඉදිරියට කරගෙන යාමට ගැටලු ඇති වී තිබුණි. විශේෂයෙන් මළ අපජල පද්ධතිය ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් වෙනම ප්‍රසම්පාදනය කර අමතර කොන්ත්‍රාත්තුවක් ලෙස ලබාදී ඇත. එහි ඇස්තමේන්තුගත අගය යුධ හමුදාව විසින් පිළියෙල කරන | ව්‍යාපෘති සැලසුම් කරන ලද කාලසීමාවන් තුළ අවසන් කර, අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා විධිමත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | මෙතෙක් ඇස්තමේන්තු සකස්කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු ශීර්ෂයේ ගෙවන ලද වැටුප් හා අතිකාල දීමනා වියදම් හැර මේ දක්වා රුපියල් මිලියන 105 කට වඩා වැඩි වියදමක් දරා තිබුණ ද, 2024 පෙබරවාරි 06 දින වන විටත් නිමකර නොතිබුණි. මුදල් රෙගුලාසි 136(1) ප්‍රකාරව අදාළ සේවාව උචිත අධිකාරී බලයට ආවරණයදී ඇති වැය සම්මතයේ හෝ බලය දෙනු ලැබූ මුදල් ප්‍රතිපාදනවලට ඇතුළත් විය යුතු අතර, ඊට අනුගත නොවී භාණ්ඩාගාර අනුමැතියෙන් ද තොරව පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කාර්යයන් ඉටුකළ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයට 2021 වර්ෂය මුල සිට 2023 වර්ෂය අවසානය දක්වා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සංයුක්ත දීමනා වශයෙන් රු.22,293,250 ක් ගෙවා තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 1.3 වගන්තියට අනුගත නොවී මෙම ව්‍යාපෘතියේ නියුක්ත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය සඳහා 2020 නොවැම්බර් මස සිට 2021 දෙසැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදයට සංයුක්ත දීමනා ලබා දෙමින් සුළු පරිපාලන ප්‍රසම්පාදන මණ්ඩල තීරණය අනුව ඔවුන් ලබාගත් ආහාරපාන වෙනුවෙන් බන්ධනාගාර ආපනශාලාවට ගෙවිය යුතු රු.4,677,625 ක මුදලක් මෙම ව්‍යාපෘතිය යටතේ ගෙවා තිබුණි. | ලද ඇස්තමේන්තුවලට ඇතුළත් නොවේ. මේ සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් බොහෝ වාර ගණනක් පවත්වා අවශ්‍ය උපදෙස් අදාළ පාර්ශවයන් වෙත ලබාදී ඇති නමුත්, එම පාර්ශවයන් හට ඍජු බලපෑමක් සිදු කිරීමට අප දෙපාර්තමේන්තුවට නොහැකි වී ඇත. ඉදිරි අත්‍යාවශ්‍ය අමතර අමුද්‍රව්‍ය බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි පල්ලන්සේන ආයතනය මගින් ප්‍රසම්පාදනයකර ලබාදීමටත් තීරණයකර ඇත. | |
| (ආ) | 2019 ඔක්තෝබර් 19 වන දින කෑගල්ල බන්ධනාගාර භූමිය තුළ සිදු වූ නාය යෑම හේතුවෙන් අස්ථාවර වූ භූමිය ස්ථාවර කිරීම සඳහා පහළින් බැම්මක් ඉදිකිරීම හා නාය ගිය ස්ථානයේ ඇති තාප්පය අළුත්වැඩියාව සඳහා රු.20,667,766 ක වියදමක් දරා තිබුණි. තාප්පය කැඩී ගිය කොටස ආවරණය කිරීම සඳහා ආරක්ෂිත තහඩු | මෙම තාප්පයේ ඉතිරි කොටස් හා අනෙකුත් ඉදි කිරීම් ආරක්ෂා කරගැනීමට අදාළ වන ඉදිකිරීම් සිදු කිරීමට මේ වන විට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.<br>තාප්පය ගලවා ඉවත්කර ඇති කොටස ආරක්ෂිත තහඩු ආවරණයක් හා කම්බි වැටක් | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පූර්ණ උපදෙස් පරිදි කටයුතු කිරීමට පියවරගත යුතු ය. |

| | | |
|---|---|---|
| ආවරණයක් සහ ආරක්ෂිත කම්බි වැටක් ද ඉදිකර තිබුණ ද, නැවත නාය යෑමට හෝ තාප්පය කඩා වැටීමට ද හැකියාව පවතින බැවින් රැඳවියන් හා නිලධාරීන්ගේ ජීවිතවලට අනතුරුදායක තත්ත්වයක් පවතින අතර, ඒ අනුව ආරක්ෂාව සඳහා ආරක්ෂිත තාප්පය ඉදි කිරීම අත්‍යාවශ්‍ය බව නිරීක්ෂණය විය. | අවස්ථානුකූලව ඉදිකර ඇති අතර, අදාළ ඉදි කිරීම නිම වූ පසු එම තාවකාලික ඉදිකිරීම ඉවත් කර ආයතනයේ ආරක්ෂාව තහවුරු කිරීමට හැකි බව දන්වා ඇත. | |

**3.4. ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 ඡේදය හා ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 හි පෙන්වා ඇති පරිදි ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු විසින් භාණ්ඩ මිලදී ගැනීම් සිදු කිරීමේදී වෙළඳපොල සැඳැහුම් ක්‍රමය අනුගමනය කරමින් මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීම් කළ යුතු ය. නමුත් ඊට අනුගත නොවී කළුතර බන්ධනාගාරයේ 2023 වර්ෂයේ මුල් මාස 08 තුළ ආයතන 03 කින් පමණක් මිල කැඳවීම් සිදුකර අවස්ථා 12 කදී වටිනාකම රු.1,184,320 ක් වූ මිලදී ගැනීම් හා මීගමුව බන්ධනාගාරයේ 2023 වර්ෂයේ මුල් මාස 06 තුළ ආයතන 03 කින් පමණක් මිල කැඳවීම් සිදු කර අවස්ථා 03 කදී වටිනාකම රු.315,375 ක් වූ මිලදී ගැනීම් සිදු කර තිබුණි. මෙම මිලදී ගැනීම් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගතකර ඇති සැපයුම්කරුවන්ගෙන් පමණක් අදාළ මිල කැඳවීම් සිදුකළ යුතු වුවත්, එසේකර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 ඡේදය හා ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 හි පෙන්වා ඇති පරිදි, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු විසින් භාණ්ඩ මිලදී ගැනීමේදී වෙළඳපොල සැඳැහුම් ක්‍රමය අනුගමනය කරමින් මුද්‍රා තැබූ මිළ ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීම් කරන ලෙසටත් මිළදී ගැනීම් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගතකර ඇති සැපයුම්කරුවන් වෙතින්ම පමණක් අදාළ මිළ කැඳවීම් සිදු කරන ලෙසට සියලුම බන්ධනාගාර ආයතන වෙත උපදෙස් ලබාදුන් බව දන්වා ඇත. | යොමුගත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1.(අ) ඡේදය ප්‍රකාරව සළකා බලනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාව සඳහා අරමුදල් ලැබෙන බවට ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් සාමූහිකවත්, තනි තනිවත් වගකිව යුතු | සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් යොදා බන්ධනාගාර ආයතන 31 ක පැවති වැඩි දියුණු කිරීම් සිදු කිරීමට කටයුතුකර තිබුණි. නමුත් ඇතැම් ආයතනවල පැවති විවිධ ගැටළු මත (සිර ශ්‍රමය, තාක්ෂණ | යොමුගත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වන්නේ ය. එසේ වුවත් මීගමුව බන්ධනාගාරයේ රු.856,195 ක වටිනාකමින් යුත් මුර අට්ටාල වැසි ආවරණ සවි කිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කර ප්‍රසම්පාදන තීරණය 2022 ඔක්තෝම්බර් 24 දින ගෙන තිබුණ ද ප්‍රතිපාදන නොලැබීම නිසා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සිදුකර නොතිබුණි. | නිලධාරීන් නොමැතිකම, වැඩ පරීක්ෂකවරුන් නොමැති වීම හා ද්‍රව්‍ය සැපයුම්කරුවන් අදාළ මිලට ලබාදීමට අකමැති බව ප්‍රකාශ කිරීම ආදී) ප්‍රතිපාදන නිසි පරිදි උපයෝගීකර ගැනීම සිදු නොවිණි. මෙම වහලය සඳහා අනුමැති ලැබුණ ද වෙන්කර තිබූ ප්‍රතිපාදන අවසන්වීම මත මෙම කාර්යය ඉදිරි වසර තුළ නිම කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | |

## 3.5. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්කර 363.64 ක් වූ ඉඩම්වල හිමිකම බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පැවතිය ද වටිනාකම තක්සේරු නොකිරීම නිසා ගිණුම්ගතකර නොතිබුණි. | හිමිකම පවරාගෙන තිබුණ ද වටිනාකම තක්සේරු නොකිරීම නිසා ගිණුම්ගතකර නොමැති ඉඩම් සඳහා තක්සේරු වාර්තා කඩිනමින් ලබා දෙන ලෙසට පළාත් තක්සේරු කාර්යාලවලින් හා රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙතින් ඉල්ලීම්කර ඇත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | බන්ධනාගාර, සිරමැදිරි, එළිමහන් සිර කඳවුරු, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපොළවල් වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අක්කර 390.98 ක් වූ ඉඩම් ප්‍රමාණයක හිමිකම පවරාගැනීම සිදුකර නොතිබුණි. | මේ වන විටත් පවරා නොගත් ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කරමින් පවතින බව දන්වා සිටින අතර, මේ සම්බන්ධයෙන් සියලුම බන්ධනාගාර අධිකාරීවරුන්ගේ විශේෂ අවධානය යොමුකර පවරා නොගත් ඉඩම් කඩිනමින් පවරා ගන්නා ලෙසට දැනුවත් කර ඇත. | මෙම ඉඩම්වල හිමිකම පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයේ ආරක්ෂිත කැමරා 64 ක්, මළ නාලිකා පද්ධතියේ පිරිපහදු 02 ක්, තොරතුරු කළමනාකරණ පද්ධතියට අයත් දත්ත ඇතුළත් කිරීමට යොදාගන්නා පරිගණක යන්ත්‍රය, ඇඟිළි සලකුණු යන්ත්‍ර 02 ක් අක්‍රීය වත්කම් වශයෙන් පැවතුණි. | අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බව විගණනය වෙත දන්වා සිටිමි. | අක්‍රීය වත්කම් සුදුසු පරිදි අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නියැදි විගණන පරීක්ෂාවේදී අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ පොදු සේවා නිවාස 47 ක්, බේකරි අංශයේ වත්කම්, දළපත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ බ්ලොක් ගල් යන්ත්‍ර, මහන මැෂින්, රෙදි වියන යන්ත්‍ර ආදී විවිධ යන්ත්‍ර 49 ක්, මීගමුව බන්ධනාගාරයේ ඡායා පිටපත් යන්ත්‍ර, මහන මැෂින් ආදී විවිධ යන්ත්‍ර 11 ක්, වටරැක බන්ධනාගාරයේ බ්ලොක් ගල් සෑදීමේ යන්ත්‍රයක්, යකඩ ඇඳන් 20 සහ ජල බවුසරයක් ඌන උපයෝජිත වත්කම් වශයෙන් පැවතුණි. | ඌන උපයෝජිත වත්කම් වශයෙන් පවතින භාණ්ඩ , අවශ්‍යතාවයන් පවතින වෙනත් ආයතනවල ප්‍රයෝජනය සඳහා ලබාදීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව දන්වා ඇත. | ඌන උපයෝජිත වත්කම් පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස්කළ යුතු ය. |
| (ඉ) | 2023 සැප්තැම්බර් 07 දින බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉංජිනේරු (යාන්ත්‍රික) අංශය යටතේ ප්‍රගතිය වාර්තා කිරීමේදී මහර ප්‍රධාන ජේලර් නිල නිවාසයේ 2017 වර්ෂයේ සිට ගාල්කර ඇති 18-8096 දරන කාර් රථය 2023 පෙබරවාරි 28 දින වන විට අළුත්වැඩියා කටයුතු කිරීමට කටයුතු කරමින් පවතින බව වාර්තාකර ඇත. විගණනය විසින් සිදු කළ භෞතික පරීක්ෂාවේදී මෙම රථය මහර බන්ධනාගාරයේ නොතිබුණු අතර, බන්ධනාගාර මූලස්ථානයේ නියෝග මත රත්මලාන පිහිටි තාක්ෂණික විද්‍යාලයක් සඳහා රැගෙන ගිය බව වාර්තා වුව ද, එය විධිමත් පරිදි භාරදුන් බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි. | මහර බන්ධනාගාරයට අයත් මෙම රථයට අදාළ ලිපිගොනු සියල්ල මහර බන්ධනාගාරයේ පැවති කැරැල්ල අවස්ථාවේදී විනාශ වී ඇත. රථය රත්මලාන පිහිටි තාක්ෂණික ආයතනයකට ලබාදී ඇති බවත්, ඒ සම්බන්ධ කිසිදු ලියවිල්ලක් සොයාගත නොහැකි බවත්, මහර බන්ධනාගාරයේ අධිකාරී විසින් දන්වා ඇත. | මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඊ) | අංක PA-7034 දරන කැබ් රථය 2013 වර්ෂයේදී පුනරුත්ථාපන හා බන්ධනාගාර අමාත්‍යාංශය විසින් විධිමත් පවරාදීමකින් තොරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දළුපොත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය වෙත ලබාදීම නිසා අළුත්වැඩියාවන් සිදු කරගැනීමට නොහැකිවීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට මේ දක්වාම කැබ් රථය ධාවනයට යොදා ගැනීමට නොහැකි වී පැවතුණි. | මෙම කැබ් රථයේ අළුත්වැඩියාවන් සඳහා මිළ ගණන් කැඳවා ඇති අතර, අළුත්වැඩියාව සිදු කිරීම ආර්ථිකමය වශයෙන් අවාසිදායක බැවින් විධිමත්ව දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමෙන් අනතුරුව අපහරණ කටයුතු සිදුකිරීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. | විධිමත් පවරාගැනීමක් සිදු කර 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 ප්‍රකාරව අළුත්වැඩියා කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඩ) | 2021 මාර්තු 24 දින සිට වවුනියා බන්ධනාගාරය සතු අංක PH-1916 දරන වෑන් රථය හා 2022 මැයි 14 වන දින සිට බන්ධනාගාර මූලස්ථානය සතු අංක PA-8709 දරන කැබ් රථය අළුත්වැඩියා සිදු කර ගැනීම සඳහා බාහිර ආයතනවලට ලබාදී අවුරුදු 03 කට වඩා වැඩි කාලයක් එම ආයතනවල රඳවා තිබුණි. | වවුනියාව බන්ධනාගාරය සතු PH-1916 වෑන් රථයේ අලුත්වැඩියාව සඳහා මේ වන විට අනුමැතිය ලබාදී ඇති අතර, බන්ධනාගාර මූලස්ථානයේ PA-8709 දරන කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බවත් අදාළ අළුත්වැඩියාවෙන් පසු ආයතන වෙත රැගෙන යාමට කටයුතු කරන බව දන්වා ඇත. | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඪ) | නියැදි විගණන පරීක්ෂාවේදී කොළඹ රිමාන්ඩ්, අගුණකොළපැලැස්ස, මීගමුව බන්ධනාගාරවල හා දළුපොත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ බස් රථ 13 ක් හා ගිලන් රථයක මයිලෝ මීටර් මාස 03 ත් වසර 4 ත් අතර කාලපරිච්ඡේදයක් තුළ අක්‍රීය වී පැවති අතර එම කාලය තුළ කිලෝමීටර් 395,688 ක් ධාවනය සඳහා ඉන්ධන ලීටර් 95,392 ක් භාවිතා කර තිබුණි. | මයිලෝ මීටර් අක්‍රීයව පවතින කොළඹ රිමාන්ඩ්, අගුණුකොළපැලැස්ස, මීගමුව යන බන්ධනාගාරයන්හි වාහනවල මයිලෝමීටර් අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කිරීමට උපදෙස් ලබාදී ඇති අතර, දළුපොත තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයට අදාළ වාහනයේ මයිලෝ මීටරය මේ වන විට අළුත්වැඩියාව සිදුකර ඇති බව දන්වා සිටී. | අක්‍රිය වූ මයිලෝ මීටර් අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු ය. |

**3.6. පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (01) යටතේ ඉදිරිපත් කර තිබූ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු හා සිද්ධීන් අතරින් වසර 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන වාහන අනතුරු 28 ක් ඇතුළු සිද්ධීන් 33 කට අදාළ අලාභය රු.36,220,218 ක් ද, වසර 05 සිට 10 අතර කාලයක සිට පැවත එන වාහන අනතුරු 79 ක් ඇතුළු සිද්ධීන් 80 කට අදාළ අලාභය රු.15,651,990 ක් ද, 2023 වර්ෂයේ වූ වාහන අනතුරු 30 ක් ඇතුළුව වර්ෂ 05 කට වඩා අඩු කාලයක සිට පැවත එන | අනුමැතිය ලද පසු කපා හැරීම් සිදු කිරීමට කටයුතු කරන බව විගණනය වෙත දන්වා සිටී. | මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වාහන අනතුරු 77 ක් ඇතුළුව සිද්ධීන් 78 ක් සම්බන්ධ අලාභය රු.49,955,804 ක් බව නිරීක්ෂණය විය. මෙම අලාභ හානිවලින් වාහන 06 කට අදාළ අනතුරු සම්බන්ධව රු.2,937,032 ක අලාභයක් පොත්වලින් කපා හැරීමට නිර්දේශ කර තිබුණ ද අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මෙතෙක් ලැබී නොතිබුණි. | | |
| (ආ) | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (01) යටතේ ඉදිරිපත් කර තිබූ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු හා සිද්ධීන් අතුරින් 2017 සිට 2021 වර්ෂය අවසානය දක්වා සිදු වූ අලාභ 05 ක අලාභය 2024 පෙබරවාරි 28 දින තෙක්ම තක්සේරුකර නොතිබුණි. | විගණන විමසුම මගින් පෙන්වාදී තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු හා අලාභ සම්බන්ධ සිද්ධි 05 හි අලාභය තක්සේරු කිරීම සඳහා අදාළ ආයතන වෙතට දන්වා කඩිනමින් එම වටිනාකම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා ඇත. | වාහන අනතුරු ඇතුළු අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 හි සඳහන් පරිදි ක්‍රියාකළ යුතු ය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 104(03) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් නැති වීම් හා පාඩු වීම් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු ය. නමුත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 1998 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති අලාභ හානි 122 ක් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. | ප්‍රාරම්භක වාර්තා සියලුම ආයතන මගින් ගෙන්වා ගැනීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක - 08/2023 හා 2023 මාර්තු 29 වන දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය මගින් දන්වා යවා ඇති අතර, අදාළ වාර්තා ලැබෙන අනුපිළිවෙල අනුව විගණනය සඳහා යොමු කරන බව දන්වා ඇත. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානි සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු නමුත්, ඉහත නිරීක්ෂණයෙන් පෙන්වාදී ඇති ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කර නොමැති අලාභ හානි 122 කට අමතරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 1998 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිදුවී ඇති අලාභ හානි 34 ක් සම්බන්ධව පූර්ණ වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණි. | වාහන අනතුරුවලට අදාළ පූර්ණ වාර්තා අදාළ ආයතන වෙතින් කඩිනමින් ගෙන්වා විගණනය වෙත ඉදිරිපත් කරන බව දන්වා සිටී. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අංක NC-5426 දරන රථයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් ටොයෝටා ලංකා පුද්ගලික සමාගම විසින් 2022 ජනවාරි 05 වන දින හා 2022 ඔක්තෝබර් 19 වන දින පිළිවෙලින් රු.4,974,724 ක් සහ රු.8,656,243 ක් වූ ඇස්තමේන්තු දෙකක් ඉදිරිපත් කර තිබුණි. එසේ වුව ද, 2022 ජුනි 18 දිනැති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ලිපිය අනුව, අළුත්වැඩියාව සිදුකර පරීක්ෂාව සඳහා ඉදිරිපත් කිරීම හෝ එසේ කිරීමට නොහැකි නම් ඊට හේතු දක්වන ලෙස වූ දැනුවත් කිරීමට ප්‍රතිචාර දක්වා නොතිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව රජයට සිදු වූ අලාභය හඳුනාගෙන ඒය පියවාගැනීමට කටයුතුකර නොතිබුණි. එසේම මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අනතුර සිදු වූ දින සිට තුන්මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, විගණන අවස්ථාව වන තෙක් එම වාර්තාව ඉදිරිපත්කර නොතිබුණි. | ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීම ප්‍රමාද වීම මත මෙම අලුත්වැඩියාව අනුමත කාලසීමාව තුළදී සිදු කිරීමට නොහැකි වූ බැවින් රක්ෂණ කොන්දේසි නැවත සලකා බලන ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත 2022 ජනවාරි 12 වන දින ලිපියක් යොමුකර ඇත. මෙම අලුත්වැඩියාව සඳහා ප්‍රමාදය සිදුවී ඇත්තේ රජයේ ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සිදු කිරීම සඳහා ගත කළ යුතු කාලය නිසා බැවින් එම කාලය නිලධාරීන්ගේ පාලනයෙන් තොර බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 103, 104 හා 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඊ) | අගුණකොළපැලැස්ස, මීගමුව, කළුතර බන්ධනාගාර ආයතනවල හා දළුපොත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ 2023 වර්ෂය තුළ විදුලි බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරීමේදී නියමිත කාලපරිච්ඡේදය තුළ නොගෙවීම නිසා දඩ මුදල් (අධිභාර) වශයෙන් රු.1,392,311 ක් හා අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ 2023 වර්ෂය තුළ ජල බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරීමේදී නියමිත කාලපරිච්ඡේදය තුළ නොගෙවීම නිසා දඩ මුදල් (අධිභාර) වශයෙන් රු.188,306 ක් ගෙවා තිබුණි. | අක්මුදල් ලබාදුන් විගස ප්‍රමාදයකින් තොරව බන්ධනාගාර ආයතන වෙත අක්මුදල් නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 780 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 3.7. අනාර්ථික ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියැදි විගණන පරීක්ෂාවේදී 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දින 31 ක තුළ වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන් අවස්ථා 233 කදී නිලධාරීන්ගේ නිවාස පරිශ්‍රයන් තුළ | බන්ධනාගාර දෛනිකව සුද්ධ පවිත්‍ර කටයුතු සිදුකළ යුතු බැවින් සිරකරුවන් යොදවා බන්ධනාගාර පරිශ්‍රයන් සුද්ධ පවිත්‍ර කිරීම අත්‍යාවශ්‍ය නොවන කාරණයක් | 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | සේවයේ යොදවා තිබූ අතර, බන්ධනාගාර නියාමක නිලධාරීන්ගේ මිනිස් දින 234 ක කාලයක් ද ඒ සඳහා වැය කර තිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ නිවාස ආශ්‍රිත පරිශ්‍රයන් වෙත සිරකරුවන් රැගෙන යාම සඳහා අවස්ථා 62 කදී බන්ධනාගාර මූලස්ථානයේ සංචිත වාහන 09 ක් කිලෝමීටර් 372 ක් ධාවනයකර තිබුණි. 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 මගින් අතිකාල වියදම් ද දැඩි සේ පාලනය කිරීම අත්‍යාවශ්‍ය බව අවධාරනයකර තිබුණ ද, 2023 වර්ෂයේ අතිකාල හා නිවාඩු දීමනා වශයෙන් රුපියල් මිලියන 982 ක් වැය කර තිබුණු අතර, එය 2022 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 106 ක වැඩිවීමක් විය. | ලෙස බැහැර කරලිය නොහැකි බවත්, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වසරේ අතිකාල දීමනා රුපියල් මිලියන 106 ක වැඩිවීමට උක්ත කරුණ බලපෑමක් ඇති කර නොමැති බවත් අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOJ/E10/අති/අනු/දෙ/2023 හා 2023 සැප්තැම්බර් 12 වන දිනැති ලිපිය මගින් නිලධාරීන් විසින් උපයාගනු ලබන මුළු අතිකාල ප්‍රමාණය පැය 200 ක් සඳහා ලබාදුන් අනුමැතිය නිසා බව දන්වා ඇත. | |
| (ආ) | 2023 ජනවාරි 27 වන දින නිකුත් කළ අංක 1/2023 දරන අයවැය චක්‍රලේඛයේ 2 (ඇ) (III) ඡේදයේ දක්වා ඇති පරිදි 1003 වැය විෂයය සංකේත යටතේ ගෙවීම් සිදු කරන විට සත්‍ය සේවා අවශ්‍යතාවයක් පවතින වැය සඳහා පමණක් ගෙවීම් කළ යුතු බව සඳහන් වුව ද, ඊට අනුගත නොවී ජේලර්වරුන්ගේ රාත්‍රී මුර සංචාර සඳහා ගෙවීම් සිදු කර තිබුණි. නමුත් පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ සිරකරුවන් රාත්‍රී කාලයේදී රඳවා නොමැති වුව ද, එම පරිශ්‍රය තුළ ජේලර් රාත්‍රී මුර සංචාර සිදු කිරීම වෙනුවෙන් 2023 වර්ෂයේදී අවස්ථා 12 කදී රු.125,200 ක මුදලක් ගෙවා තිබුණි. | පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ ජේලර්වරුන් රාත්‍රී සංචාර සිදු කිරීම සම්බන්ධව කඩිනමින් පරීක්ෂණයක් සිදුකර ගෙවා ඇති මුදල් නැවත අයකර ගැනීම සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ගයන් ගන්නා බව දන්වා සිටී. | 2023 ජනවාරි 27 වන දින නිකුත් කළ අංක 1/2023 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**3.8. විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

දෙපාර්තමේන්තු වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2024 ජූලි 17 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 07 ක් සඳහා 2024 ජූලි 17 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි. | විගණන විමසුම් සඳහා පිළිතුරු කඩිනමින් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් විගණනය වෙත දන්වා සිටී. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තිය හා මුදල් රෙගුලාසි 155 |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලබන වෙනත් ඕනෑම නිලධාරියෙකු විසින් තමන් වෙත අමතනු ලබන ලිඛිත හා විමසීම් පිළිබඳ අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීමට ගණන්දීමේ නිලධාරියා කටයුතු කළ යුතු ය. |

## 3.9. කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇප මුදල් ගෙවීමට නොහැකි වරදකරුවන් සිරගත කරන අතර, එම සිරකරුවන්ගේ ඇප මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් සිරදඬුවමින් නිදහස් කළ යුතු ය. නමුත් මීගමුව බන්ධනාගාරයේ 2023 ජනවාරි මාසය තුළ ඇප මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද දිනයේම සිරදඬුවමින් මුදාහැර නොතිබූ අවස්ථා 121 ක් නිරීක්ෂණය විය. | මීගමුව බන්ධනාගාරයට අදාළ මිනුවන්ගොඩ, මාරවිල, හලාවත, පුත්තලම, කල්පිටිය, හා ආණමඩුව යන අධිකරණවලින් ඇප නියෝග නිකුත් කළ විට එම ඇප නියෝග මීගමුව බන්ධනාගාරයේ සිර ලියාපදිංචි අංශය වෙත පැමිණෙන්නේ අධිකරණ ආරක්ෂණ අවසානයේ වන අතර, එවිට අධිකරණ කාර්යාල කටයුතු අවසන් බැවින් පසුදින එම ඇපකරුවන් අධිකරණ වෙත ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන බව දන්වා ඇත. | ඇප මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද දිනයේම සිරකරුවන් සිර දඬුවමින් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | දඩ මුදල් ගෙවීමට නොහැකි වරදකරුවන් සිරගත කරන අතර, එම සිරකරුවන්ගේ දඩ මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් සිරදඬුවමින් නිදහස් කළ යුතු ය. නමුත් මීගමුව බන්ධනාගාරයේ 2023 ජනවාරි 01 දින සිට 2023 ජුනි 30 දින දක්වා කාලපරිච්ඡේදය තුළ නිදහස් කිරීමේ නියෝග ලද දිනයේම සිරදඬුවමින් මුදාහැර නොතිබූ අවස්ථා 292 ක් නිරීක්ෂණය විය. | මීගමුව බන්ධනාගාරයට අදාළ මිනුවන්ගොඩ, මාරවිල, හලාවත, පුත්තලම, කල්පිටිය, හා ආණමඩුව යන අධිකරණවලින් මුදා හැරීමේ නියෝග නිකුත් කළ විට එම නියෝග මීගමුව බන්ධනාගාරයේ සිර ලියාපදිංචි අංශය වෙත ලැබෙනුයේ අධිකරණ ආරක්ෂණ රාත්‍රී කාලයේදී බන්ධනාගාරය වෙත පැමිණි පසු ය. රාත්‍රී කාලයේදී සිරකරුවන් මුදා හැරීම සඳහා | නිදහස් කිරීමේ නියෝගය ලද වහාම සිරකරුවන් සිර දඬුවමින් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | නීතිමය හැකියාවක් නොමැති බැවින් පසුදින මුදාහැරීමට කටයුතු සිදුකරනු ලබන බවත් බන්ධනාගාරය සවස වැසීමට ප්‍රථමව ලැබෙන මුදා හැරීම් එදිනම සිදුකරන බවත් දන්වා ඇත. | |
| (ඇ) | නීති විරෝධී ලෙස ජංගම දුරකතන රඳවා තබා ගෙන රැඳවියන් විසින් බන්ධනාගාරයේ පිටත බාහිර පාර්ශවයන්ට ලබාගන්නා ඇමතුම් අවහිර කිරීම සඳහා බන්ධනාගාර තුළ ස්ථාපිතකර තිබුණු දුරකතන සංඥා අවහිර කිරීමේ පද්ධති නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව මීගමුව හා අගුණකොළපැලැස්ස බන්ධනාගාරවල සිදු කළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙම පද්ධතිය රාජ්‍ය ආරක්ෂක ආමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් බැවින්, එම පද්ධතිය සම්බන්ධව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් කිසිදු ක්‍රියා කරවීමක් හෝ හැසිරවීමක් සිදු කිරීමට හැකියාවක් නොමැත. ඒ අනුව එම පද්ධතියේ පවතින සියලු දෝෂ තත්ත්වයන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත දැන්වීමට කටයුතුකර ඇත. | දුරකථන සංඥා අවහිර කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා නිසියාකාරව සංඥා අවහිර කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කළ යුතු ය. |
| (ඈ) | ආයතන සංග්‍රහයේ XIX වෙනි පරිච්ඡේදයේ 5.2.1 ඡේදය ප්‍රකාරව උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකම් නැති (පොදු සේවා නිවාස ලබාගත්) විවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 12 1/2 ක් නිවාස කුලී ලෙස අයකරගත යුතු වුවත්, ඊට අනුගත නොවී 2023 වර්ෂයේ බන්ධනාගාර ආයතන 05 ක උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකම් නැති විවාහක නිලධාරීන් 76 දෙනෙකුගෙන් රු.2,334,509 ක් නිවාස කුලී ලෙස අයවිය යුතු වුවත්, නිවාස කුලිය සඳහා වැටුපෙන් සියයට 10 ක් පමණක් එනම් රු.1,864,952 ක් අයකරගෙන තිබුණි. මේ අනුව රු.469,557 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි. | විගණනය විසින් පෙන්වාදී ඇති පරිදි ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.2.1 ඡේදය ප්‍රකාරව නිල නිවාස කුලී අය කිරීමට සියලුම බන්ධනාගාර ආයතන වෙත උපදෙස් ලබාදී ඇති අතර, විගණනය පෙන්වාදී ඇති රු.469,557 ක හිඟ මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කිරීමට ද උපදෙස් ලබාදුන් බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ XIX වෙනි පරිච්ඡේදයේ 5.2.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඉ) | මුදල් රෙගුලාසි 210 ප්‍රකාරව වට්ටම් ලබාගත හැකි සෑම අවස්ථාවකදී ම එම වට්ටම් ලබාගැනීමට හැකිවනු පිණිස කල් ඇතුව ගෙවීම් කළ යුතු වුවත්, අගුණකොළපැලැස්ස, කළුතර, මීගමුව, වටරැක හා දළුපත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ ගිණුම් 15 කට අදාළව 2023 වර්ෂයේ ජල බිල්පත් ගෙවීමේදී අදාළ කාලය තුළ ගෙවීම් සිදු නොකිරීම නිසා රු.488,461 ක ප්‍රමාණයක වට්ටම් ලබාගැනීමට නොහැකි වී තිබුණි. | අක්මුදල් ලබාදුන් විගස ප්‍රමාදයකින් තොරව බන්ධනාගාර ආයතන වෙත අක්මුදල් නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 210 ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | බන්ධනාගාරය විසින් රාජ්‍ය අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු.148,826,252 ක ශේෂය තුළ වසර 20 කට වඩා පැරණි රු.2,377,921 ක් හා වසර 5-20 ත් අතර රු.23,643,153 ක ශේෂ හා පෞද්ගලික අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු. 35,618 ක ශේෂයන් තුළ වසර 20 කට වඩා පැරණි රු. 19,034 ක් හා වසර 10-20 ත් අතර රු.16,584 ක ශේෂ දීර්ඝ කාලයක සිට පැවතිය ද ඒවා මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව අප්‍රමාදව අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | කර්මාන්ත අංශ පවත්වාගෙන යන බන්ධනාගාර ආයතන විසින් රාජ්‍ය අංශයට සිදුකරන ලද විකුණුම්වලදී සෑම වර්ෂයක් අවසානයේදීම බිල්පත් පියවීමේදී හිඟ බිල්පත් ප්‍රමාණයක් වාර්ෂිකව පවතිනු ඇත. මෙම හිඟ බිල්පත්වලින් වැඩි ප්‍රමාණයක් 2015 ට පෙර ඒවා වන අතර, මේ සම්බන්ධයෙන් වඩාත් නිවැරදි සටහන් කිරීමක් නොමැති අතර හිඟ බිල්පත් නිරවුල් කිරීමට උපදෙස් ලබාදුන්න ද පැරණි බිල්පත් අස්ථාන ගතවීම නිසා නිවැරදි සංඛ්‍යා ලේඛන ලබාගැනීමට අපහසුවී ඇත. පුද්ගලික අංශයෙන් ලැබිය යුතුව පවතින රු.35,618.00 ක මුදල සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලබාගැනීමට නොහැකි වී ඇති බැවින්, අයකර ගැනීමේ අපහසුතාවයක් පවතින අතර, 2013 වසරේ සිට එවැනි ශේෂයක් නොමැති බව ද දන්වා සිටී. | මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (උ) | පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව හා අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුගතව රැඳවියන්ගේ මානසික හා ශාරීරික යෝග්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතු වුවත්, 2023 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂාව අනුව බන්ධනාගාර ආයතන 05 ක සිර වාට්ටු 62 ක රැඳවිය යුතු රැඳවියන් සංඛ්‍යාවට වඩා වැඩිපුර රැඳවියන් 2,601 දෙනෙකු රඳවා තිබුණු අතර, අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ වාට්ටු 12 ක රැඳවිය යුතු සංඛ්‍යාවට වඩා අඩුවෙන් රැඳවියන් 127 දෙනෙකු රඳවා තිබුණි. | සෑම විටම එක්සත් ජාතීන්ගේ ප්‍රමිතීන්ට අනුව හා බන්ධනාගාර අඥා පනතේ විධි විධාන ප්‍රකාරව සිරකරුවන් හා සැකකරුවන් රැඳවීමේ මූලධර්ම ආරක්ෂා කිරීමටත්, වර්ගීකරණයන් අනුව රැඳවීමටත් අවශ්‍ය කටයුතු සිදු කිරීමට උපරිම උත්සහයක් ගන්නා බව දන්වා සිටින අතර, වෙනත් නඩු කටයුතු ඇති රැඳවියන් අධිකරණ වෙත ඉදිරිපත් කිරීමේ පහසුව තකා එම අධිකරණයන්ට ආසන්න බන්ධනාගාර තුළ රඳවා ඇති බැවින් ඉඩකඩ සහිත වෙනත් බන්ධනාගාරයන් වෙත මාරු කිරීම සිදු නොකරනුයේ ඒ සඳහා අමතර පිරිවැයක් ද දැරීමට සිදුවන නිසා බව ද වැඩිදුරටත් දන්වා සිටී. | පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා බන්ධනාගාර ආඥා පනතේ (54 අධිකාරිය) 94 වගන්තිය යටතේ සකස් කරන ලද 179 රීතියට හා අභ්‍යන්තර චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු ය. |
| (ඌ) | අධිකරණය මගින් බන්ධනාගාරගත කර ඇති සැකකරුවන්ට අදාළව පොලීසිය විසින් රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ මත්ද්‍රව්‍ය සාම්පල්වලට අදාළ රස පරීක්ෂණ වාර්තා මෙතෙක් ඉදිරිපත් නොවීම නිසා 2023 වර්ෂයේදී විගණන | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් මෙම සැකකරුවන්ගේ රස පරීක්ෂණ වාර්තා ලබාදීම ප්‍රමාදවීම මත ඔවුන් දීර්ඝ කාලයක් බන්ධනාගාරගතව සිටීමේ තත්ත්වය බන්ධනාගාර | රස පරීක්ෂණ වාර්තා කඩිනමින් ලබාගැනීම මගින් සැකකරුවන්ට අදාළ ක්‍රියාමාර්ග ගැනීම විධිමත් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | නියැදි පරීක්ෂාව අනුව අගුණකොළපැලැස්ස, කළුතර හා මීගමුව යන බන්ධනාගාර ආයතනවල රක්ෂිත බන්ධනාගාරගතකර ඇති සැකකරුවන් සංඛ්‍යාව 1,421 දෙනෙකු විය. | දෙපාර්තමේන්තුවට පාලනය කළ හැකි තත්ත්වයක් නොවන බව දන්වා ඇත. | |
| (එ) | නියැදි විගණන පරීක්ෂාවේදී 2023 ඔක්තෝබර් 01 දින වන විට අධිකරණය මගින් පුනරුත්ථාපනය සඳහා නියෝග ලබාදී පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට අපේක්ෂාවෙන් මාස 06 කට වැඩි කාලයක් අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 45 ක් විය. | වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් නොවන භෞතික සම්පත් ලබාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තු යටතේ ඉල්ලීම් කිරීමට කටයුතු කරන බවත් අවශ්‍ය මානව සම්පත් ලබාගැනීමට අවශ්‍ය අවස්ථාවලදී බාහිර පාර්ශවයන්ගේ සහයෝගය ලබාගැනීමට කටයුතු කරන බව සඳහන්කර ඇත. | පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි සපයාගෙන සිරකරුවන් විධිමත් පරිදි පුනරුත්ථාපනය කළ යුතු ය. |
| (ඒ) | අගුණකොළපැලැස්ස, වටරැක, මීගමුව, වැලිකඩ, මහර හා බෝගම්බර යන බන්ධනාගාර ආයතනවල 2023 ජනවාරි සිට නොවැම්බර් මාසය අවසානය දක්වා කාලපරිච්ඡේදය තුළ නැවත නැවත බන්ධනාගාර ගත වී ඇති සිරකරුවන් 2,316 ක් විය. තව ද බන්ධනාගාරයේ නැවත නැවත සිරගත වන පුද්ගලයන් හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් පවා බන්ධනාගාරය තුළ නොමැති අතර, දැනට එම සිරකරුවන් හඳුනාගනු ලබන්නේ ඔවුන් විසින්ම ලබාදෙන වාචික තොරතුරු අනුව බව විගණනයේදී නිරීක්ෂණය විය. | සිරකරුවන් නැවත නැවත බන්ධනාගාර ගත වීම සිදුවන්නේ වැඩි වශයෙන් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් ය. මත් ද්‍රව්‍ය පුනරුත්ථාපනයේදී ඔවුන්ට අවශ්‍ය උපදේශන සේවාව අන්තරායකාර ඖෂධ පාලක මණ්ඩලයේ උපදේශක නිලධාරී මාර්ගයෙන් ලබාදීමට සිදු කරන බව දන්වා ඇත. | නැවත නැවත සිරගත වීම අවම කිරීම සඳහා ශක්තිමත් හා විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් ඇති කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඔ) | බන්ධනාගාර ආඥා පනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සිදු කළ සංශෝධනයන්හි 223 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව සෑම සිරකරුවෙක් සඳහාම උපලේඛන II හි දැක්වෙන විධිවිධානයන්හි පරිමාණයන්ට අනුව රජය විසින් අනුමත කරන ලද සිර ඇඳුම් ඇඳීම සහ භාවිතා කිරීම කළ යුතු වුවත්, අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ 2023 නොවැම්බර් 13 දින වන විට සිරකරුවන් 500 දෙනෙකුට අධික සංඛ්‍යාවක් සිටිය ද ඔවුන් අතුරින් සිරකරුවන් 75 දෙනෙකුට පමණ සිර ඇඳුම් නොමැතිවීම නිසා තමන් පුද්ගලිකව සපයා ගත් ඇඳුම් භාවිතා කරනු ලබයි. අනෙකුත් සිරකරුවන්ට | සෑම සිරකරුවෙක් සඳහාම අවශ්‍ය කරන සිර ඇඳුම් බන්ධනාගාර මූලස්ථාන ගබඩා අංශයෙන් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට සියලුම බන්ධනාගාර ආයතන වෙත උපදෙස් ලබාදුන් බව දන්වා ඇත. | බන්ධනාගාර ආඥා පනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සිදු කළ සංශෝධනයන්හි 223 පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ලබාදී ඇති සිර ඇඳුම් ද හොඳ තත්ත්වයේ නොමැති බව නිරීක්ෂණය විය. | | |
| (ඕ) | බන්ධනාගාරවල පවතින අසාමාන්‍ය තදබදයට මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි නිසා බන්ධනාගාරගතවීම් ප්‍රධාන හේතුවක් වන අතර, ඒ සම්බන්ධ රැඳවියන්ගෙන් බොහෝ දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් නිසා කවර ආකාරයකින් හෝ අවශ්‍ය මත්ද්‍රව්‍ය ප්‍රමාණය ලබාගැනීමට ඔවුන් උත්සාහ කරනු ලබන අතර, එවැනි තත්ත්වයන් වැලැක්වීමට බන්ධනාගාර නිලධාරීන්ට වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවීම නිසා බන්ධනාගාරයේ ප්‍රධාන අරමුණු කරා ළගාවීමට මෙන්ම බන්ධනාගාර අභ්‍යන්තර ආරක්ෂාව හා ක්‍රියාකාරීත්වයට බාධාවක් වී ඇත. මේ සම්බන්ධව මීගමුව හා කළුතර බන්ධනාගර තුළ සිදු කළ භෞතික පරීක්ෂාවේදී මීගමුව බන්ධනාගාරයේ 2023 අගෝස්තු 27 වන දිනට මුළු රැඳවියන් සංඛ්‍යාව වූ 2,225 න් සියයට 65 ක් එනම් 1,442 ක් ද, කළුතර බන්ධනාගරයේ 2023 සැප්තැම්බර් 19 දිනට රඳවා සිටින මුළු රැඳවියන් සංඛ්‍යාව වූ 1,275 න් සියයට 69 ක් එනම් 885 ක් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ වන රැඳවියන් විය. | මත්ද්‍රව්‍ය පුනරුත්ථාපනයේදී ඔවුන්ට අවශ්‍ය උපදේශන සේවාව අන්තරායකාර ඖෂධ පාලක මණ්ඩලයේ උපදේශක නිලධාරී මාර්ගයෙන් ලබාදීමට සිදු කරයි. මත්ද්‍රව්‍ය භාවිතයෙන් රක්ෂණභාරයට පත්වන රැඳවියන් ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා බව පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කරන මෙන් මහෙස්ත්‍රාත්තුමන්ලා දැනුවත් කර ඇත. බන්ධනාගාර සුභසාධන අංශය මගින් ද මෙම මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් දිගින් දිගටම ක්‍රියාත්මක කරනු ලබයි. | කාලීන අවශ්‍යතාවයට ගැළපෙන පරිදි රැඳවියන් යහපත් පුරවැසින් ලෙස පිටත්වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතුරින් එකක් වන බැවින් ඊට අදාළ අනිකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් කටයුතු කළ යුතු ය. |
| (ක) | අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ 2023 සැප්තැම්බර් 30 දින වන විට සිරකරුවන් විසින් ඉදිරිපත් කර නිරාකරණය නොවූ මාස 03 ට වැඩි අභියාචනා 145 ක් වූ අතර, ඉන් 106 ක් වසර 02 කට වැඩි විය. | සිරකරුවන් විසින් අභියාචනා ඉදිරිපත් කර මේ වන තෙක් නිරාකරණය නොවූ අභියාචන සිරකරුවන් 145 දෙනෙකු අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රඳවා සිටි අතර, කොවිඩ් වසංගත රෝග තත්ත්වය හමුවේ එම කාලයේ සිට මේ දක්වා අභියාචන සිරකරුවන් ZOOM තාක්ෂණය ඔස්සේ අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබී ය. | අභියාචනා කඩිනමින් නිරවුල් කිරීමට අදාළ කටයුතු සම්පාදනය කර දිය යුතු ය. |
| (ග) | ගරු අධිකරණය මඟින් බන්ධනාගාරගත වන රැඳවියන් වෙනුවෙන් ඇප නියමවී තිබුණ ද, අදාළ රැඳවියන් හට ඇප කොන්දේසි සපුරාලීමට නොහැකිවීම තුළ මීගමුව බන්ධනාගාරයේ 2023 අගෝස්තු 15 | ඇප කොන්දේසි සපුරාලීමට නොහැකි වීම මත මෙලෙස බන්ධනාගාර ගතව සිටින රැඳවියන් සම්බන්ධව 1991 අංක 08 දරන රිමාන්ඩ් භාරයේ සිටින සැකකරුවන් මුදවා හැරීමේ පනත | ඇප කොන්දේසි කඩිනමින් සපුරාලීම අවශ්‍ය කටයුතු සුදානම්කර දිය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | දින වන විට දීර්ඝ කාලයක් බන්ධනාගාරගත වී සිටින රැඳවියන් 229 ක් නිරීක්ෂණය විය. | යටතේ පවතින නීතිරාමුව තුළ ඒ පිළිබඳව අදාළ අධිකරණ දැනුවත්කර ඔවුන් පුද්ගලික ඇප මත මුදවා හැරීම, වරද භාරගෙන සිර දඬුවම් ලබා නඩු කටයුතු අවසන් කිරීම් හා ලබාදී ඇති ඇප කොන්දේසි ලිහිල්කර සහන සැලසීම සිදුකරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරුන් මේ පිළිබඳව දැනුවත්කර එම අධිකරණ වෙත ඇප තබාගැනීමට නොහැකි රැඳවියන් පිළිබඳව නාම ලේඛන ඉදිරිපත් කිරීම කරනු ලබන බව දන්වා ඇත. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අනුමත නිලධාරීන් සංඛ්‍යාව 7,872 ක් වූ අතර, තථ්‍ය නිලධාරීන් සංඛ්‍යාව 6,173 ක් වූයෙන් තනතුරු 02 කට අදාළ අතිරික්ත නිලධාරීන් 18 ක් හා තනතුරු 79 කට අදාළ පුරප්පාඩු නිලධාරීන් 1,717 ක් පැවතුණි. | රජය විසින් සියලුම බඳවාගැනීම් නවතා ඇති අවස්ථාවක වුවත්, නවක නිලධාරීන් බඳවාගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ 2023 ජනවාරි 04 දිනැති ලිපියේ අනුමැතිය ලබාදී ඇති පරිදි බන්ධනාගාර නියාමක (පිරිමි) 300 හා කාන්තා (47) බන්ධනාගාර නියාමක 347 සඳහා බඳවාගැනීමට අදාළව අයදුම්පත් කැඳවීම්කර විභාග කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි 2024 මාර්තු 16 දින තරඟ විභාගය පවත්වා එහි ප්‍රතිඵල මත ඉදිරි සම්මුඛ පරීක්ෂණ සිදුකිරීමටත්, බඳවාගැනීම් සිදුකර ආධුනික පුහුණුව ලබාදීමටත් නියමිත ය. ඒ අනුව ආයතනවල ඇති පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු පරිදි කටයුතු කරන බව දන්වා ඇත. | ඵලදායී සේවා මට්ටමක් පවත්වාගැනීම සඳහා සේවක මණ්ඩල සමාලෝචනයක් සිදු කර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීමට කළමනාකරණය පියවරගත යුතු ය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර රෝහල් 14 කට අදාළව අතිරික්ත ශ්‍රේණිගත වෛද්‍යවරුන් 22 ක් සහ බන්ධනාගාර රෝහල් 05 කට අදාළව පුරප්පාඩු ශ්‍රේණිගත වෛද්‍යවරුන් 09 ක් වූ අතර, | බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අදාළ බන්ධනාගාර රෝහල් වෙත වෛද්‍යවරුන් අනුයුක්ත කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් බැවින් වෛද්‍යවරුන්ගේ කාර්යසාධනය සම්බන්ධව කටයුතු | බන්ධනාගාර රෝහල්වලට වෛද්‍යවරුන් අනුයුක්ත කිරීමේදී අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| | බන්ධනාගාර රෝහල් 04 ක අතිරික්ත ලියාපදිංචි වෛද්‍යවරුන් 05 ක් සහ බන්ධනාගාර රෝහල් 03 ක පුරප්පාඩු ලියාපදිංචි වෛද්‍යවරුන් 05 ක් විය. 2023 ජුනි 09 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළව වෛද්‍යවරුන් බන්ධනාගාර රෝහල්වලට පැමිණීම හා පිටවීම සම්බන්ධ දොරටු ලේඛනයන්හි ඇතුළත් තොරතුරු බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණ ද බන්ධනාගාර රෝහල් කිහිපයකට අනුයුක්තව සේවය කරන වෛද්‍යවරුන්ගේ විස්තර පමණක් යොමුකර තිබූ අතර, ඒවා ද ක්‍රමානුකූලව සකස් කරන ලද වාර්තා නොවී ය. | කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පරිපාලනයෙන් බැහැර කාරණාවක් බව දන්වා සිටී.<br><br>තව ද වෛද්‍යවරුන්ගේ පැමිණීම හා පිටවීමේ වාර්තා සෑම මසකම 05 වන දිනට ප්‍රථමව බන්ධනාගාර මූලස්ථානය වෙත එවීමට කටයුතු කරන ලෙසට අංක-ඩී22/සෞඛ්‍ය/2017(1) හා 2023 අගෝස්තු 10 වන දින හා 2023 දෙසැම්බර් 22 වන දිනැති ලිපි මඟින් සියලුම බන්ධනාගාර ආයතන වෙත දන්වා යවා ඇත. ඒ අනුව මේ වන විට ලැබී ඇති 2024 අප්‍රේල් මස දක්වා වෛද්‍යවරුන්ගේ පැමිණීමේ හා පිටවීමේ වාර්තා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීමට කටයුතුකර ඇති බව දන්වා සිටී. | සමග ඒකාබද්ධව විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතු වීම සහ 2023 ජුනි 09 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කළ යුතු ය. |
| (ඇ) | ප්‍රධාන ජේලර් තනතුර සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත උසස් කිරීමේදී බන්ධනාගාර ජේලර්වරුන්ගේ සංගමයට අයත් තනතුරුවලට අදාළව නිලතල දැරීම සඳහා ලකුණු ලබාදී තිබූ නමුත්, පසුගිය වර්ෂ හතරකට ආසන්න කාලයක් තුළ මහා සභා රැස්වීම් නොපවැත්වීම නිසා අනෙකුත් නිලධාරීන්ට ද මෙම තනතුරු ලබා ගැනීමට තිබූ හැකියාව අහුරා තබා ඇති බැවින් හා ජේලර් සංගමයේ නිලතල දැරුව ද ප්‍රමාණවත් කාර්යසාධනයක් ඉටු නොවී ඇති බැවින් නිලතල දැරූ පමණින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම තුළින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අනිකුත් නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට බන්ධනාගාර නිලධාරීන් සාමාජිකත්වය දරන සියලුම සංගම්වල කටයුතු ක්‍රමාණුකූලව විධිමත් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව ද විගණනය වෙත දන්වා සිටී. | විධිමත් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති අංක 251 ප්‍රකාරව භූගෝලීය වශයෙන් එකම ප්‍රදේශයක පිහිටි සේවා ස්ථාන අතර, ස්ථාන මාරුවීම් ලබාගනිමින් දිගින් දිගටම එකම ප්‍රදේශයක රැඳී සිටීමට නිලධාරීන් දරන උත්සහයන් වැළැක්වීම සඳහා වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති හා පටිපාටි සැකසීමේදී | දිවයිනේ ප්‍රාදේශීය ආයතන සුළු ප්‍රමාණයක් පිහිටා තිබීමත්, වර්තමානයේ රට තුළ පවතින දැඩි ආර්ථික අපහසුතා මත රාජ්‍ය සේවකයන්ට මුහුණ දීමට සිදුව ඇති දැඩි ආර්ථික අපහසුතා සැලකිල්ලට ගෙන වියදම් කළමනාකරණයකර ගැනීමේ අරමුණ ඇතිව තමන් පදිංචි ගම් | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටියක රීති අනුව වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්ති සකස්කර ක්‍රියාත්මක කළ යුතු ය. |

සැලකිල්ලටගත යුතු වේ. නියැදි විගණන පරීක්ෂාවේදී 2024 මාර්තු 31 දින වන විට බන්ධනාගාර ආයතන 10 ක නිලධාරීන් 377 දෙනෙකු බන්ධනාගාරයට අනුයුක්ත කළ දිනයේ සිට වසර 06 ත් වසර 25 ත් අතර කාලයක සිට එම බන්ධනාගාරයේම අඛණ්ඩව සේවය කරන බව නිරීක්ෂණය විය. මෙයින් නිලධාරීන් 29 දෙනෙකු මීට පෙර ද එම බන්ධනාගාර ආයතවලටම අනුයුක්තව සේවයකර ඇති බව ද වැඩිදුරටත් නිරීක්ෂණය විය.

ප්‍රදේශවල රාජ්‍ය සේවා ස්ථානවල සේවය කිරීමට අවස්ථාව සලසාදී ඇත.

2023 වර්ෂයට අදාළව කාලය සම්පූර්ණ සැම නිලධාරියෙකුම ස්ථාන මාරු ඉල්ලුම් කළ අතර, නිලධාරීන්ගේ සාධාරණ හේතු මත සමහර නිලධාරීන්ට ස්ථාන මාරු ලබාදීම සිදුකර නොමැත. ඒ අනුව බන්ධනාගාර වෙත ස්ථාන මාරු පැමිණි නිලධාරීන් සංඛ්‍යාවට අදාළව පමණක් මුදාහැරීමේ කටයුතු සිදුකොට ඇත.